# සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

# සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ

# සත්ත්ව සංවර්ධන උපදේශක තනතුරේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ

# විවෘත තරග විභාගය - 2026

සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ සත්ත්ව සංවර්ධන උපදේශක තනතුරේ III ශ්‍රේණියේ පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම්ලත් සබරගමුව පළාතේ ස්ථිර පදිංචි අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. පවතින පුරප්පාඩු සංඛ්‍යාව : 06

02. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය : 2026.03.20

03. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවු. 18 ට නොඅඩු සහ 35 ට නොවැඩි විය යුතුය.

04. බඳවා ගැනීමේ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් :

| **අධ්‍යාපන සුදුසුකම්** | | **වෘත්තීය සුදුසුකම්** |
|---|---|---|
| **අ.පො.ස. (සා. පෙළ) සුදුසුකම** | **අ.පො.ස (උ. පෙළ) සුදුසුකම** | |
| මව්බස (සිංහල / දෙමළ/ ඉංග්‍රීසි භාෂාව) විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්වීම. | අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ ජෛව විද්‍යා විෂය ධාරාව යටතේ (ජෛව විද්‍යාව සමග රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, කෘෂි විද්‍යාව, යන විෂයයන්ගෙන් දෙකක්) හෝ ජෛව පද්ධති තාක්ෂණවේදය විෂය ධාරාව යටතේ (ජෛව පද්ධති තාක්ෂණවේදය, තාක්ෂණවේදය සඳහා විද්‍යාව සහ කෘෂි විද්‍යාව) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි විෂයයක් ලෙස ගණන් ගනු නොලැබේ) | i. සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන සත්ත්ව පාලන පුහුණුව පිළිබඳ විද්‍යාලයකින් ලබාගත්තා ලද සත්ත්ව පාලන ඩිප්ලෝමා සහතිකය.<br>**හෝ**<br>ii. අනුරාධපුර/ සිප්පුකුලම සත්ත්ව පාලන පුහුණු මධ්‍යස්ථාන මගින් නිකුත් කරනු ලබන දෑවුරුදු ඩිප්ලෝමා සහතිකය.<br>**හෝ**<br>iii. කරඳගොල්ල සත්ත්ව පාලන විද්‍යාලය මගින් නිකුත් කරනු ලබන දෑවුරුදු ඩිප්ලෝමා සහතිකය. |

05. තනතුරට අදාළ වැටුප් පරිමාණය:-

අංක 10/2025 හා 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව මෙම තනතුරේ III වැනි ශ්‍රේණියට අදාළ වැටුප් කාණ්ඩය MN 3 – 2025 වන අතර, මාසික වැටුප් පරිමාණය. 52,250- 10X800- 11X1190- 10X1320- 10X1350 - රු. 100,040/-

06. මෙම තනතුරට බඳවා ගැනීමේ සම්පූර්ණ නිවේදනය සහ ආදර්ශ අයදුම්පත්‍රය **www.sg.gov.lk** හා **www.psc.sg.gov.lk** වෙබ් අඩවිවල පළකර ඇත.

**ඩබ්. ආර්. දිනීෂා එස්. රත්නායක**
**ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,**
**සබරගමුව පළාත.**
2026.02.19